රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ :- 3/99

මගේ අංකය : 1/51/පොදු/1(පො)
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ-07.
1999 ජනවාරි මස 29 දින

සියළුම
අමාත්‍යාංශ ලේකම්වරුන,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන් සහ
ප්‍රාදේශිය ලේකම්වරුන් වෙත.

**රජයේ යතුරු ලේඛක සේවයේ 1 වෙනි පන්තියේ**
**<u>උසස්වීම් පෙරදාතම් කිරීම</u>**

පහත සඳහන් නිලධාරී කණ්ඩායම්වලට 1 වෙනි පන්තියට ලබා දී ඇති උසස්වීම් 1979 සැප්තැම්බර් 30 වෙනි දිනට පෙරදාතම් කිරීමට රජය තිරණය කොට ඇත.

(I) යෝග්‍යතා පරීක්ෂණ වලින් සමත්ව, 1973 මැයි 05 වන දින සිට යතුරු ලේඛක සේවයේ "අ" ඛණ්ඩයට උසස්වීම් ලැබ පසුව, එම උසස්වීම් 1996 ජනවාරි 31 දිනැති අංක: 01/96 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය ප්‍රකාර, 1972 සැප්තැම්බර් 30 වන දිනට පෙරදාතම් කරනු ලැබූ නිලධාරින්,

(II) යෝග්‍යතා පරීක්ෂණවලින් සමත්ව 1974 මාර්තු 30 වන දින සිට, යතුරු ලේඛක සේවයේ "අ" ඛණ්ඩයට උසස්වීම් ලැබ පසුව, එම උසස්වීම් 1996 ජනවාරි 31 දිනැති අංක: 01/96 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය ප්‍රකාර, 1972 සැප්තැම්බර් 30 වන දිනට පෙරදාතම් කරනු ලැබූ නිලධාරින්,

02. මෙම උසස්වීම් පෙරදාතම් කිරීම පහත සඳහන් කොන්දේසි වලට යටත් වේ.

(I) යතුරු ලේඛක සේවයේ 1 වෙනි පන්තියේ නිලධාරින්ගේ ජ්‍යෙෂ්ඨත්වය සංශෝධනය කිරීම

(II) හිඟ වැටුප් ගෙවීමකින් තොරව නියමිත වැටුප් පියවරෙහි තැබීම

(III) කුසලතා පදනම මත, ශ්‍රී ලංකා පරිපාලන සේවය වැනි වෙනත් සේවාවන්ට සිදු කරන උසස්වීම් වලට, මෙම පෙරදාතම් කිරීම මගින් ලබා ගත් ජ්‍යෙෂ්ඨත්වය සඳහා වැඩිපුර ලකුණු ලබා ගැනීමට අයිතිවාසිකමක් නොලැබේ.

(IV) අනුමත උසස් කිරීම් ක්‍රියා පරිපාටියෙන් බාහිරව යතුරු ලේඛක සේවයේ අධිපන්තියට උසස්වීම් ලබා ගැනීම සඳහා, මෙම පෙරදාතම් කිරීම් පදනමක් නොවිය යුතුය.

03. උසස්වීම් පෙරදාතම් කිරීමට සුදුසුකම් ලබන නිලධාරින්, අමුණා ඇති ආකෘති පත්‍රය පිරිදී තම අයදුම්පත් අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතු වේ.

04. මෙම චක්‍රලේඛයේ සඳහන් කරුණු අදාළ නිලධාරින්ගේ අවධානයට කරුණාකර යොමු කරන්න.

පී.ඒ. සේනාරත්න
ලේකම්
රාජ්‍යපරිපාලන ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

......................................මගින්,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ.

ඒකාබද්ධ යතුරු ලේඛක සේවයේ II "අ" ඛණ්ඩයට උසස් කිරීම සඳහා වූ
1973.05.05 සහ 1974.03.30 දිනවල පැවැති යෝග්‍යතා පරීක්ෂණවලින් සමත් වූ
නිලධාරීන්ගේ පත් කිරීම් පෙරදාතම් කරන ලෙස ඉල්ලීම

**1. කොටස :- (බලධාරියා විසින් පිරවීම සඳහා)**

01. නිලධාරියාගේ සම්පූර්ණ නම :- ..........................................................................................

02. දැනට සේවය කරන ස්ථානය :- ..........................................................................................
(අමාත්‍යාංශය /දෙපාර්තමේන්තුව/පළාත් සභාව සඳහන් කරන්න)

03. 1973.05.05 / 1974.03.30 දින සේවය කළ ස්ථානය :-
(උචිත පරිදි සේවය කළ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව සඳහන් කරන්න.)
..........................................................................................................................
..........................................................................................................................
..........................................................................................................................

04. යතුරු ලේඛක සේවයේ II "ආ" ඛණ්ඩයට පත් කළ දිනය :-..............................................
(තනතුරේ වැඩ භාර ගත් දිනය සඳහන් කරන්න)

05. යතුරු ලේඛක සේවයේ II "අ" ඛණ්ඩයට උසස් කිරීමේ යෝග්‍යතා පරීක්ෂණය පැවැත්වූ දිනය :-
..........................................................................................................................
විභාග අංකය :- ..................................................

06. යතුරු ලේඛක සේවයේ II "අ" ඛණ්ඩයට පත් කළ දිනය :- ..................................................

07. (අ) 1996 ජනවාරි 31 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක. 01/96 අනුව, II "අ" පත්වීම පෙරදාතම් කර තිබේද ? :- ..........................................................................................

(ආ එසේ II "අ" පත්වීම පෙරදාතම් කලේ නම් ඒ කවර දිනයට ද :-

08. පළාත් රාජ්‍ය සේවයට අන්තර් ග්‍රහණය කර ඇත්නම් පළාත් රාජ්‍ය සේවය සඳහා ස්ථිරව/ තාවකාලිකව මුදාහල දිනය :-

09. දැනට රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගෙන ඇත්නම් විශ්‍රාම ගත් දිනය :-
..................................................

ඉහත සපයා ඇතිතොරුරු සත්‍ය බව සහතික කරමි.

දිනය:- ..................................................

..........................................................
අයදුම්කරුගේ අත්සන

**<u>II කොටස</u>**

**<u>අමාත්‍යාංශ ලේකම්ගේ/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ පළාත් රාජ්‍ය සේවාකොමිෂන් සභාවේ ලේකම්ගේ සහතිකය</u>**

(අ) ..........................................................මහතා/මහත්මිය/ මෙනෙවිය විසින් සපයා ඇති විස්තරවල නිවැරදිතාවය සොයා බැලූ අතර ඒවා නිවැරදි බවද,

(ආ) 1996 ජනවාරි 31 දිනැති අංක : 01/96 දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය ප්‍රකාර ඔහුගේ/ ඇයගේ II "අ" පත්වීම ........................................... දිනට පෙරදාතම් කර ඇති බව ද,

(ඇ) ඔහු/ඇය .................................. දිනැති අංක : ................................ දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පරිදි යතුරු ලේඛක සේවයේ 1 වන පන්තියේ පත්වීම 1979 සැප්තැම්බර් 30 දිනට පෙරදාතම් කිරීම සඳහා සෑම අතින්ම සුදුසුකම් ලබා ඇති බව ද සහතික කරමි.

දිනය :- ...................

..............................................
සහතික කරන්නාගේ අත්සන

නම හා තනතුර :-

(මෙම සහතිකය අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා /පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ පරිපාලන කටයුතු භාර නියෝජ්‍ය ප්‍රධානියා විසින් හෝ අත්සන් කළයුතුය.)